# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2003/5 - 2017 ජනවාරි මස 23 වැනි සඳුදා - 2017.01.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම.

*යොමු අංකය* : HAK/LAN/1/5.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩ පත්තුව සුළු කොට්ඨාසයේ වේපතඉර දකුණ ගමේ පිහිටි, මාතර දිස්ත්‍රික්කයේ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කර ඇති අවසාන ගම් පිඹුර 184 හි පත්‍ර අංක 12 හි සඳහන් පහත විස්තර දැක්වෙන ඉඩම් කැබැල්ල.

**කැබලි අංක 259 — ඉඩමේ නම: බාලමහත්තයාගේ වත්ත; ඉඩම් හිමියන්ගේ නම්: එච්. පී. පී. ද සිල්වා, එච්. එම්. හිල්ඩා ශ්‍රියාණි, එච්. පී. වයලට්, එච්. පී. පියසීලි, වයලට් එදිරිසූරිය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2092.**

*මායිම් විස්තරය* :

*උතුරට*: කැබලි අංක 100; *නැගෙනහිරට*: කැබලි අංක 100 සහ 150; *දකුණට*: කැබලි අංක 150; *බටහිරට*: කැබලි අංක 100.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 පෙබරවාරි මස 27 වැනි දින පෙ. ව. 10.00 ට හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2017 පෙබරවාරි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
හක්මණ.

2017 ජනවාරි මස 17 වැනි දින.
හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-320

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24982 – 27 (2017/01)

ශුද්ධි පත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*මගේ අංකය* : බ/ඉ/1/3/1.
*ඉඩම් අමා. අංක* : 03/ජේ/86/68/එච් ඒ/346.

මොනරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් විසින් අංක 1994/42 හා 2016.11.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 7 වන වගන්තිය යටතේ *ගැසට් පත්‍රයට* අනුව සටහන් වී ඇති ප්‍රමාණය හෙක්. 0.0812 යන්න වෙනුවට එහි ප්‍රමාණය හෙක්. 0.812 ලෙසට නිවැරදි විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

කසුන් එස්. කේ. වැල්ලහේවා,
ප්‍රාදේශීය ලේකම්,
බඩල්කුඹුර.

2017 ජනවාරි මස 18 වැනි දින,
බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-321

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.